# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2012

2015 - ජනවාරි

**BCOM E2025 - සංවිධාන චර්යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. සංවිධාන චර්යාව යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 02)

ආ. " සංවිධාන චර්යාව යනු තනි පුද්ගල චර්යාවන්ගේ එකතුවකි." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වේද ? විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. සංවිධාන චර්යාව විකාශයෙන් සංවර්ධනයට මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව ඇසුරින් සිදු වූ දායකත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඉ. කළමනාකරණ ශ්‍රිත සඳහා සංවිධාන චර්යාව ගැලපිය යුතු ආකාරය විස්තර කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

02. අ. සමූහයක් යන්න නිර්වචනය කර ඒවා වර්ග කර දක්වන්න.

(ලකුණු 02)

ආ. පුද්ගලයන් සමූහ වශයෙන් එකතු වීමට කැමැත්තක් දක්වයි. පුද්ගලයන්ට සමූහ වශයෙන් එක් රැස්වීමට බලපෑම ඇති කරවන සාධක කවරේද ?

(ලකුණු 06)

ඇ. " ඉහළ සංසක්තියක් ඇති සමූහයන් ඉහල ඵලදායිතාවයක් සඳහා ප්‍රවණතාවක් දක්වයි." ඔබ මෙම පාඨය සමඟ එකඟ වේද ? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. සංවිධාන තුල ඇති සමූහ සංවර්ධනයේ පියවරයන් 05 විස්තර කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. අ. අභිප්‍රේරණය යනු කුමක් ද ?

(ලකුණු 02)

ආ. කළමනාකරුවන්ට තම සේවකයන් අභිප්‍රේරණය සඳහා අභිප්‍රේරණ න්‍යායන් පිළිබඳ ඇති දැනුම ඉවහල් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. ස්වායන්ත පාරිතෝෂික, පරායන්ත පාරිතෝෂික, ධනාත්මක පාරිතෝෂික සහ සෘණාත්මක පාරිතෝෂික පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. කළමනාකරුවන්ට තම සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා අභිමතාර්ථ තබා ගැනීමේ න්‍යාය මඟින් උදව් ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

04. අ. " බලය ඇති වන්නේ වියහැකි හෝ සම්පූර්ණයෙන් ව්‍යුක්ත කරනු ලබන පරායන්ත සබැඳියාවේ බලපෑම මතයි. " මෙම පාඨය සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

ආ. බලය මූලාශ්‍ර හඳුන්වන්න. කුමන බල මූලාශ්‍රය වඩා ඵලදායීද ? විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ. " දේශපාලනය යනු සම්පත් හිඟකම මත ස්වභාවිකව ඇති වන හේතුවකි." ඔබ මෙම පාඨය සමඟ එකඟ වේද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ඉ. දේශපාලන ක්‍රියාකාරකම් සඳහා බොහෝ සේවකයින් තුල පහළ සිට මධ්‍යස්ථ දක්වා කැමැත්තක් සහ විවිධ ප්‍රතික්‍රියා පවතී. සංවිධාන දේශපාලනය සඳහා පුද්ගලයන් ප්‍රතිචාර දක්වන්නේ කෙසේද ?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

05. අ. කෙටි අතට සන්නිවේදනය , උඩ අතට සන්නිවේදනය සහ පාර්ශ්වික සන්නිවේදනය අතර සමාන අසමාන කම් පහදන්න.

(ලකුණු 04)

ආ. මිදිවැල සන්නිවේදනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ? එහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

ඇ. කාලීන සංවිධාන තුල ප්‍රධානතම සන්නිවේදන ක්‍රමය ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයයි. එහි ඇති වාසි සහ අභියෝගයන් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 05)

ඉ. " මාධ්‍යය සාරවත්භාවය " සන්නිවේදන මාධ්‍යයන් තෝරා ගැනීමට උපකාරී වේ. කළමනාකරුවකු ගැලපෙන සන්නිවේදන මාධ්‍යය තෝරා ගත යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

06. කෙටි සටහන් ලියන්න.

අ. පංච මහා පෞර්ෂත්ව න්‍යාය

ආ. ප්‍රභා මණ්ඩල ඵලය

ඇ. ගැටුම්

ඉ. ප්‍රභේද ඵලය

(ලකුණු 05x04 = මුළු ලකුණු 20)